# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2053/27 – 2018 ජනවාරි 10 වැනි බදාදා – 2018.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/V/2015/94.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන පරිච්ඡේදය වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම.**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.09.09 වන දින අංක. 1983/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2016.09.05 වැනි දින දරන නියෝගයෙන්.

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්.යූ. එම්. එස්. රාජකරුණා මයා, අංක 71/4, හේවාහැට පාර, තල්වත්ත, මහනුවර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2016.08.11 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය/ පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. දනන්සූරිය මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2016.09.05 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.
01-685/1


1A – G 26919– 07 (2018/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/V/2015/94.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්.යූ. එම්. එස්. රාජකරුණා මයා, අංක 71/4, හේවාහැට පාර, තල්වත්ත, මහනුවර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

**අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,**

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික අරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්:

වේයන්ගොඩ, පත්තලගෙදර,මොරටුවත්ත, අංක 114/1, පී.දනන්සූරිය මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/V/2015/94.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්.යූ. එම්. එස්. රාජකරුණා මයා, අංක 71/4, හේවාහැට පාර, තල්වත්ත, මහනුවර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

'' ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ යටිනුවර ඩිපෝවේ සේවය කරන ආර්. යූ. එම්. එස්. රාජකරුණා මහතාට මහනුවර බස් කම්පැනි ලිමිටඩ් හි සේවක මණ්ඩල කළමණාකරුගේ අංක මබස/සේමකො/ පා/ 01/2004 හා 2004.01.29 දිනැති ලිපිය මගින් ලබා දී තිබූ වැටුප් වර්ධක මහනුවර බස් කම්පැනි ලිමිටඩ් සේවක මණ්ඩල කළමණාකාරගේ අංක මබස/සේමකො/ පා/ 01/2004 හා 2004.06.21 දිනැති ලිපිය මගින් අඩුකිරීම යුක්ති සහගතද යන්න හා එලෙස යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 දෙසැම්බර් මස 22 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්ගේ කාර්යාලයේ දීය.

01-685/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.